Department of Education, Sabaragamuwa Province/ Weekly School

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව - සති පාසල

ශ්‍රේණිය 10

සතිය - 16

Prepared by - වී.එම්.මධුරංගනී
(කෑ/දෙහි මොරලිය කණිෂ්ඨ විද්‍යාලය)

විෂය - ගණිතය

## පළමු වාරය - පුනරීක්ෂණ අභ්‍යාසය 4

### ප්‍රතිලෝම සමානුපාත

1. වත්තක් සම්පූර්ණයෙන්ම පිරිසිදු කිරීමට මිනිසුන් 4 දෙනෙකුට දින 10 ක් ගතවේ.මිනිසුන් 8 දෙනෙකුට ඒ සඳහා ගතවන දින ගණන කොපමණද?

2. කිසියම් වැඩක් සම්පූර්ණයෙන්ම නිම කිරීමට මිනිසුන් 6 දෙනෙකුට දින 14 ක් ගතවේ නම් එම වැඩය දින 2කින් අවසන් කිරීමට අවශ්‍ය මිනිසුන් ගණන කොපමණද?

3. පාරක් සෑදීමේ නිරත සේවකයන් 20ක් සඳහා දින 10කට සෑහෙන ආහාර ඇත.දින 5කට පසු තවත් සේවකයන් 5 දෙනෙක් කණ්ඩායමට එකතු වූයේ නම් ඉතිරි ආහාර දින කීයකට සෑහේද?

4. එක්තරා වැඩක් නිම කිරීමට මිනිසුන් 12 දෙනෙකුට දින 3 ක් ගතවේ. එමෙන් දෙගුණයක් වූ වැඩක් නිම කිරීම සඳහා මිනිසුන් 8 දෙනෙකුට ගතවන දින ගණන කොපමණද?

5. මිනිසුන් තිදෙනෙකුට කාණුවක් කැපීමට දින 6ක් ගතවේ.ඔවුන්ගෙන් එක් අයෙකු පළමු දින තුනේ දී පමණක් වැඩට නොපැමිණියේ නම් ,ඔවුන් තිදෙනාට එම වැඩය නිම කිරීමට ගතවන මුළු දින ගණන කීයද?

6. එක සමාන ජල පොම්ප පහකින් පැය 8ක කාලයකදී ටැංකියකට ජලය පිරවිය හැකිය.ජල පොම්ප පහම යොදා ටැංකිය පිරවීමට කටයුතු කලද හරියටම පැය දෙකකින් පොම්ප 2ක් ක්‍රියා විරහිත විය.ඉතිරි පොම්ප තුනෙන් ටැංකිය පිරවීම සිදු කළ අතර ජල පොම්ප දෙක ක්‍රියා නොකිරීම නිසා ටැංකිය පිරවීමට වැඩිපුර ගතවූ කාලය සොයන්න.


7. පැයට කිලෝමීටර් 60ක වේගයෙන් ගමන් කරන මෝටර් රථයක් එක් නගරයක සිට තවත් නගරයකට යාමට පැය 2ක් ගතවේ.එම මෝටර් රථයම පැයට කිලෝමීටර් 50ක වේගයෙන් ගමන් කලේ නම් ගමණට ගතවන කාලය සොයන්න.

8. වහලයක් සෑදීම දින 18කින් නිමා කළ මිනිසුන් කණ්ඩායමක්, එවැනිම වැඩ ප්‍රමාණයන් සහිත වැඩක් කිරීමට තවත් මිනිසුන් 10ක් කණ්ඩායමටබඳවා ගනු ලැබීය.එම වැඩය දින 6කදී නිමකලේ නම්, මුල් කණ්ඩායමේ සිටි මිනිසුන් ගණන කීයද?

**<u>දත්ත නිරූපණය</u>**

**(01)**

වර්ග මීටර් 1440ක් තුල වගා කළ වී, රබර්, තේ, පොල් පිළිබඳ තොරතුරු වට ප්‍රස්තාරයේ දැක්වේ.




(i) වැඩිම භූමි ප්‍රමාණයක් වගා කර ඇත්තේ කුමණ බෝගයද?


(ii) අඩුම භූමි ප්‍රමාණයක් වගා කර ඇත්තේ කුමණ බෝගයද?

(iii) එක් එක් වගාවන් වගා කර ඇති භූමි ප්‍රමාණ වෙනවෙනම සොයන්න.

(02) පංතියක සිසුන් වඩාත් කැමති ක්‍රීඩාව පිළිබඳව තොරතුරු වට ප්‍රස්තාරයේ දැක්වේ.ක්‍රිකට් වලට කැමති සිසුන් ගණන 40 නම් ,

(i) පාපන්දු වලට කැමති සිසුන් ගණන කීයද?

(ii)වොලිබෝල් හා නෙට්බෝල් වලට කැමති සිසුන් ගණන වෙනවෙනම සොයන්න.



(03) එක්තරා පාසලක සිසුන් 720කගෙන් තමා කැමති විෂය පිළිබඳව තොරතුරු විමසා ලබාගත් දත්ත පහත දැක්වේ.

| විෂය | සිසුන් ගණන |
|---|---|
| ගණිතය | 250 |
| විද්‍යාව | 190 |
| සිංහල | 110 |
| ඉංග්‍රීසි | 170 |

(i) එක් එක් විෂයට කැමති සිසුන් දක්වන කේන්ද්‍ර කෝණ වෙනවෙනම සොයන්න.

(ii) මෙම තොරතුරු වට ප්‍රස්ථාරයක ඇඳ දක්වන්න.

<u>වීජීය ප්‍රකාශනවල කුඩාම පොදු ගුණාකාරය</u>

**(01) පහත දැක්වෙන වීජීය පද සහිත ප්‍රකාශන වල කුඩාම පොදු ගුණාකාරය සොයන්න.**

**(i)** $8a^2, 4ab$

**(ii)** $x^2y, xy^2$

**(iii)** $6, 3p, 8q$

**(iv)** $5ab, 10a^2b, 2ab^2$

**(v)** $4m, 8mn, 12m^2$

**(vi)** $8x, 6xy, 4x^2$

**(vii)** $24, 8z, 10z^2$

**(viii)** $Pq, pq^2$

**(02) පහත දැක්වෙන ද්විපද ප්‍රකාශන සහිත වීජීය ප්‍රකාශන වල කුඩාම පොදු ගුණාකාරය සොයන්න.**

(i) $x-4, 8-2x$

(ii) $9(p-1), 15(p+1), 9(p-1)$

(iii) $(y-1), (1-y)^2$

(iv) $3n+6, 2n-4$

(v) $3(m-2), (m^2-4)$

(vi) $(a-b), (a^2-b^2)$

(vii) $x(x-y), xy(x^2-y^2)$

(viii) $2(p-1), 2p(p^2-1)$

(ix) $b^2+2b+1, 2(b+1)$

(x) $5(3-x), (x-2)(x-3)$